“යුදෙව්වන් හා කිතුනුවන් කෙරහි නුඹලා සලාම් පවසා ආරම්භ නොකරනු. ඔවුන් මාර්ගයේ සිටිනු නුඹලා දුටු විට ඔවුන් එහි කෙළවරින් ගමන් කිරීමට සළස්වනු.”

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “යුදෙව්වන් හා කිතුනුවන් කෙරහි නුඹලා සලාම් පවසා ආරම්භ නොකරනු. ඔවුන් මාර්ගයේ සිටිනු නුඹලා දුටු විට ඔවුන් එහි කෙළවරින් ගමන් කිරීමට සළස්වනු.”
[صحيح] [رواه مسلم]

යුදෙව්වන් හා කිතුනුවන් දිම්මී හෙවත් ඉස්ලාමීය රාජ්යය තුළ වෙසෙන සුළුතර අය වුව ද ඔවුන් කෙරෙහි සලාම් පවසා කතාව ආරම්භ කිරීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ වැළැක්වූහ. දේවත්වය ප්රතික්ෂේප කරන මිථ්යා දෘෂ්ටිකයින්ට ද එලෙසමය. පසුව සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැහැදිලි කළහ. සැබැවින්ම අපි ඔවුන් මාර්ගයක දුටු විට මාර්ගයේ අයිනට ඔවුන් යොමු කළ යුතු වේ. මාර්ගයේ මැද ගමන් කළ යුත්තේ දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයාය. පසෙකට වී සිටින තැනැත්තා දේවවිශ්වාස නොකරන්නා වන අතර මුස්ලිම්වරයා කිසිම ආකාරයකින් නින්දාවට පත් නොවේ.

https://sunnah.global/hadeeth/si/show/5347